සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** # ක්‍රිස්තියානි ධර්මය - I **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**සැලකිය යුතුයි :**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ''මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නාවූ මාගේ පුත්‍රයා මට පෙරටුව එවන්නෙමි....'' යනුවෙන් මලාකි දිවැසිවරයා ප්‍රකාශ කරනු ලැබූයේ,
    (1) ස්නාවක ජොහන් පිළිබඳව ය. (2) ජේසුස් වහන්සේ පිළිබඳව ය.
    (3) ග්‍රාබ්‍රියෙල් දේවදූතයා පිළිබඳව ය. (4) පාවුල්තුමා පිළිබඳව ය.

02. බිළිඳු ජේසු බැලීමට පළමුව එඬේරුන්ගේ පැමිණීමෙන් පැහැදිලි වන කරුණකි,
    (1) බැටළුවන්ට ජේසුතුමා වඩාත් කැමැති බව. (2) ජේසු උපතින් දිළින්දන්ව රජයන බව.
    (3) ජේතුමා දේව පුත්‍රයාණන් බව. (4) රජවරුන්ට පාර වැරැදීම නිසා පමා වූ බව.

03. බබිලෝනියේ සිට සෑම අතින්ම සරුසාර වූ දේශය කරා ජන කණ්ඩායම් වල සංක්‍රමණය සිදු වූයේ,
    (1) ක්‍රි.පූ. 16 වන සියවසේදී ය. (2) ක්‍රි.පූ. 19 වන සියවසේදී ය.
    (3) ක්‍රි.පූ. 20 වන සියවසේදී ය. (4) ක්‍රි.පූ. 22 වන සියවසේදී ය.

04. දාවිත් රජ පරපුරෙන් මෙසියස් වහන්සේ පැමිණෙන බව පූර්ව දැනුම් දීමක් කළ දිවැසිවරයා වූයේ,
    (1) මීකා දිවැසිවරයා ය. (2) මලාකි දිවැසිවරයා ය.
    (3) යෙසායා දිවැසිවරයා ය. (4) එසකියෙල් දිවැසිවරයා ය.

05. නව ගිවිසුම තුළ යහපත් එඬේරාණන් ලෙස හඳුන්වනු ලබන්නේ,
    (1) ජේසුස් වහන්සේ ය. (2) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.
    (3) ආත්මයාණන් වහන්සේ ය. (4) දෙවියන් වහන්සේ ය.

06. ''මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත.'' ගාබ්‍රියෙල් දේව දූතයා මෙසේ ප්‍රකාශ කරනු ලැබූයේ,
    (1) සෙකරියස්ට ජොහන්ගේ උපත දැන්වූ අවස්ථාවේදී ය.
    (2) මරියා එළිසැබෙත් බලන්න ගිය අවස්ථාවේදී ය.
    (3) මරියාට ජේසු උපත දැන් වූ අවස්ථාවේදී ය.
    (4) සෙකරියස් දුම් පූජාව ඉටු කළ අවස්ථාවේදී ය.

07. මරියතුමියගේ විශිෂ්ඨ චරිතාංගයක් නම්,
    (1) දේව කැමැත්තට ඉඩ දී කරබාගෙන සිටීමයි. (2) දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයයි.
    (3) ග්‍රාබියෙල් දේවදූතයාගෙන් ප්‍රශ්න ඇසීමයි. (4) නිහතමානීව දේව කැමැත්තට අවනත වීමයි.

08. එකම රොටිය කඩා අනුභව කිරීමෙන් හා එකම කුසලානයෙන් පානය කිරීමෙන් ගම්‍ය වන්නේ,
    (1) සහෝදරත්වය හා එකමුතුකම පවත්වා ගැනීමයි.
    (2) සහෝදරත්වය හා සහභාගිත්වය නොකඩවා පවත්වා ගැනීමේ අවශ්‍යතාවයයි.
    (3) සහභාගිත්වය ඉස්මතු කර පෙන්වීමේ අවශ්‍යතාවයයි.
    (4) එකමුතුකම තුළ සහෝදරත්වය ගොඩනැගෙන බව පෙන්වීමේ අවශ්‍යතාවයයි.

09. පහත ප්‍රකාශ වෙත අවධානය යොමු කරන්න.

A - වනාන්තරයේ සිටියදී උන්වහන්සේට බඩගිනි දැනුනි.

B - කුරුසි ගසේදී උන්වහන්සේට පිපාසය දැනුනි.

C - ගෙත්සමන උයනේදී උන්වහන්සේ විඳින්න යන කුසලානේ වේදනාව දැනුනි.

මෙම අවස්ථා මගින් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් ගම්‍ය වන්නේ,

(1) උන්වහන්සේගේ දේවත්වයයි. (2) උන්වහන්සේගේ සහභාගිත්වයයි.

(3) උන්වහන්සේගේ මනුෂ්‍යත්වයයි. (4) උන්වහන්සේගේ සහෝදරත්වයයි.

10. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව තමා වටා සිටින අවශ්‍යතාවයෙන් පෙළෙන ඕනෑම කෙනෙකු අපගේ ..................... වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

(1) සහෝදරයා (2) නෑදෑයන් (3) අසල්වැසියා (4) හිත මිතුරා

11. ''ප්‍රේමය'' වඩාත් අර්ථ ගැන්වෙන්නේ,

(1) වැයවීම තුළින් ය. (2) ආදරය දක්වීමෙන් ය. (3) දානය දීමෙන් ය. (4) සාමය පැතීමෙන් ය.

12. කිතුණුවන් වන අයහට වැරැදි පිළිබඳ පසුතැවී අලුත් ජීවිතයක් ඇරඹීමට තමා තුළ ඇති කරගත යුතු ගුණාංගයකි,

(1) මනස්ථාපනය වීම (2) කමාව ලැබීම (3) ප්‍රේමය දක්වීම (4) දයාව පෙන්වීම

13. යුක්තිය හා ධර්මිෂ්ඨකම රජයන විට සාමය රජයන බව පෙන්වා දුන් දිවැසිවරයා වන්නේ,

(1) එසකියෙල් දිවැසිවරයා ය. (2) ආමෝස් දිවැසිවරයා ය.

(3) මලාකි දිවැසිවරයා ය. (4) යෙසායා දිවැසිවරයා ය.

14. ''පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි.'' යන උදාර ආකල්පය තුළ සිංහල, දමිළ, මුස්ලිම් ජන කොටස් වෙනුවෙන් තම ලැගුම් ගෙය පවා පරිත්‍යාග කළ පියතුමා වූයේ,

(1) ගරු තිස්ස බාලසූරිය පියතුමා ය. (2) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය.

(3) ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා පියතුමා ය. (4) ගරු මර්සලීන් ජයකොඩි පියතුමා ය.

15. ''තල් අතු ඉරිදා දින කිතුණු අපට වැදගත් වේ.'' පහත සඳහන් කරුණු වලින් අදාල නොවන කරුණ කුමක් ද?

(1) ජෙරුසලම් දේවමාළිගාව කිතුණු ආගමික මධ්‍යස්ථානය නිසාය.

(2) දේව මාළිගාව යාච්ඤාවේ ගෘහයක් බව ප්‍රකාශ කළ නිසාය.

(3) දේව මාළිගාව තුළ වෙළඳාම් කිරීම ජේසුස් වහන්සේ හෙළා දුටු නිසාය.

(4) ජේසුස් වහන්සේ ජයන්විතව දේව මාළිගාවට යෑම නිසාය.

16. සද්දුසිවරු ජේසුස් වහන්සේට එල්ල කළ අභියෝග දක්වෙන පිළිතුර තෝරන්න.

(1) අධිකාරි බලය, ආගමික දේවස්ථාන, පුනර්ජීවනය ගැන ප්‍රශ්න කිරීම.

(2) අධිකාරි බලය, පුනර්ජීවනය, තම වාසස්ථාන පිළිබඳ ප්‍රශ්න කිරීම.

(3) අධිකාරි බලය, ආදායම් බදු, ආගමික දේවස්ථාන පිළිබඳ ප්‍රශ්න කිරීම.

(4) අධිකාරි බලය, ආදායම් බදු ගෙවීම, පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්න කිරීම.

17. අනුන් වෙනුවෙන් ඔබට වැය වීමට ක්‍රියාත්මක වීමට හැකි අවස්ථාවකි,

(1) මගදී හමු වූ අසාධ්‍ය රෝගියකු රෝහල් ගත කිරීම.

(2) ඉරිදා දින පැවැත්වෙන ශ්‍රමදානයකට සහභාගි වීම.

(3) ගමනක් යාමට පෙර යාච්ඤා කිරීම.

(4) කුඹුරෙහි වැඩ කරන යාළුවාට උදව් වීම.

18. ජේසුස් වහන්සේට බද්ධව සිටියත්, දේව ගුණාංග ලෝකයට නොදීමට කටයුතු කරන අය උපමා කර ඇත්තේ,

(1) එල නොදරන ගස් වලටය. (2) එල නොදරන පැළෑටි වලටය.

(3) එල නොදරන වැල් වලටය. (4) එල නොදරන අතු වලටය.

19. ශුද්ධාත්ම ආගමනය සිදු වූ පෙන්තකොස්ත දින ප්‍රථම දේශනය ඉදිරිපත් කරනු ලැබුයේ,

(1) පාවුල්තුමාය. (2) පේදුරුතුමාය. (3) ජාකොබ්තුමාය. (4) බර්ණබස්තුමාය.

20. ''මේ මනුෂ්‍යයා අත කිසි වරදක් මට නොපෙනේ.'' යනුවෙන් පැවසූයේ කවුරුන් ද?
(1) සෙනග (2) පරිසිවරු (3) පිලාත් (4) හෙරොද්

21. කිතුණුවන් වන අප සැම මොහොතකම පරීක්ෂාවට නොවැටෙන පිණිස ක්‍රියා කළයුතු වන්නේ,
(1) සැම ඉරු දිනකම පල්ලි යාමෙනි.
(2) නිරතුරුවම යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් ක්‍රියාකිරීමෙනි.
(3) පියතුමාට කියා ආශිර්වාද කර ගැනීමෙනි.
(4) ජේසුතුමා විශ්වාස කර නිහඬව සිටීමෙනි.

22. පහත ප්‍රකාශය දෙස අවධානය යොමු කරන්න.

A දේව නමස්කාරයට ක්‍රියාශීලීව සහභාගි වෙයි.
B ගෞරවාන්විතව ශුද්ධ සහභාගිකමට එක් වෙයි.
C යාච්ඤාව තුළ සවිමත් ජීවිත ගත කරයි.
D දේව වචනය තුළ පිහිටා ඒ අනුව ජීවිත හැඩ ගස්වා ගනියි.

මුල් සභාවේ නමස්කාරික ජීවිතය තුළින් ගොඩ නැගෙන ආදර්ශමත් කිතුණුවා සතු ගුණාංග වන්නේ,
(1) A හා B ය. (2) B හා D ය. (3) C හා D ය. (4) ඉහත සියල්ලමය.

23. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව ස්ථිර කිරීමට අදාල සිද්ධිය වන්නේ,
(1) බෞතීස්මය ලැබීම ය. (2) කැපකිරීම ය. (3) අන්වෙසක් වීමය. (4) චර්මඡේදනයයි.

24. ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව මුල් සභාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කරනු ලැබූයේ,
(1) පාවුල්තුමාය. (2) ජාකොබ්තුමාය. (3) පේදුරුතුමාය. (4) ස්තෙපන්තුමාය.

25. කිතුණු බව්තීස්ම ස්නාපනය තුළ ශුද්ධාත්මයාණන් වැඩ සිටීම හේතු කොට ගෙන දිරිය හා සවිය ලබමින් අත්දකිනුයේ,
(1) තම ජීවිතයේ කරදරවලට පිළිතුරකි. (2) තම ජීවිතයේ නවතාවයකි.
(3) පාපය දවාලීමකි. (4) ජනතාවගේ සිත් පවිත්‍ර කිරීමකි.

26. මිහිපිට දේව රාජ්‍යය ගොඩ නැංවීමේ උතුම් මෙහෙවර දෙවියන් වහන්සේ විසින් පවරා තිබුණේ කාහටද?
(1) ආදම්ට. (2) පේදුරුතුමාට (3) ජේසුස් වහන්සේට (4) ආබ්‍රහම්ට

27. ''පරිසි'' යන්නෙහි අර්ථය වන්නේ,
(1) වෙන් වූ යන්නයි. (2) කොන් වූ යන්නයි. (3) ධනවත් වූ යන්නයි. (4) අසරණ වූ යන්නයි.

28. ''සමිඳාණන් වහන්ස මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව'' යනුවෙන් පවසනු ලැබූයේ,
(1) ජේසුස් වහන්සේ කුරුසිපත් කරන අවස්ථාවේදී ය.
(2) ස්තෙපන්ට ගල් ගසනු ලැබූ අවස්ථාවේදී ය.
(3) ජේසුස් වහන්සේ යක්ෂ ආත්ම දුරුකරන අවස්ථාවේදී ය.
(4) පාවුල් දමස්කයේදී කිතුණුවන් අල්ලා ගන්නා අවස්ථාවේදී ය.

29. ජේසුස් වහන්සේ වදාළ උපමා කථා කිහිපයක් පහත දක්වේ.

A මහා මංගල භෝජනය පිළිබඳ උපමා කථාව.
B නැතිවූ බැටළුවා පිළිබඳ උපමා කථාව.
C නැතිවූ කාසිය පිළිබඳ උපමා කථාව.
D වපුරාන්නාගේ පිළිබඳ උපමා කථාව.

මේවායින් දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ඉස්මතු කර පෙන්වීමට වදාළ උපමා කථා වන්නේ,
(1) A, B හා D ය. (2) A, C හා D ය. (3) A, B හා C ය. (4) B, C හා D ය.

30. පළමුවරට ''ක්‍රිස්තියානි'' යන නාමය ශ්‍රවකයන්ට දෙනු ලැබූයේ,
(1) ගලාති සභාවේදීය. (2) කොරෙන්තියේ සභාවේදීය.
(3) එපීස සභාවේදීය. (4) අන්තියෝකියේ සභාවේදීය.

31. කිතුණු ජීවිතයේ අභ්‍යන්තරික අගයන් කෙලෙස විය යුතුද යන්න පැහැදිලි කිරීමට ජේසුස් වහන්සේ උපමා රූපයක් ලෙස යොදා ගනු ලැබුයේ,

(1) ලුණුය. (2) පාන්ය. (3) රොටිය. (4) මිදි යුෂය.

32. ''අත් වලින් සෑදූ දෙවිවරු දෙවිවරු නොවේ'' යනුවෙන් ඉගැන්වීම් කරනු ලැබුයේ,

(1) ජේසුස් වහන්සේ ය. (2) පාවුල් ය. (3) ස්නාවක ජොහන් ය. (4) ස්තෙපන් ය.

33. කිතුණු අපගේ ජීවිත වල මූලික අරමුණ විය යුත්තේ,

(1) දේව රාජ්‍යය උරුම කර ගැනීමයි.
(2) දේව රාජ්‍යය සෙවීමයි.
(3) දේව රාජ්‍යය පිළිබඳ අන් අයට කියා දීමයි.
(4) දේව රාජ්‍යය අත ළඟ ඇති බව වටහා ගැනීමයි.

34. ''ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැකිය.'' මෙම ප්‍රකාශය කරනු ලැබුයේ,

(1) ජේසුස් වහන්සේ විසින් සාවුල්ටය.
(2) ස්නාවක ජොහන් විසින් ජේසුස් වහන්සේට ය.
(3) ජේසුස් වහන්සේ විසින් නිකදේමුස්ටය.
(4) ස්නාවක ජොහන් විසින් ජනතාවටය.

35. ජේසුතුමා දේව මාළිගාව පවිත්‍ර කිරීම මගින් වර්තමාන කිතුණුවන්ට ලැබෙන අභියෝගය නම්,

(1) හැකි සෑමවිටම වානිජ කටයුතු සඳහා ඉඩ දිය යුතු බවයි.
(2) ආගමික කටයුතු සඳහා පමණක් දේවස්ථානය ඉඩ දිය යුතු බවයි.
(3) දේවස්ථානයේ සෑම වැඩක්ම නිරවද්‍යතාවයෙන් සම්පූර්ණ විය යුතු බවයි.
(4) දේව මාළිගාව හැම විටම අතු ගා පවිත්‍රව තබා ගත යුතු බවයි.

36. වර්තමාන සමාජයේ ජීවත්වන කිතුණුවන් කුණාටු අබියස දී,

(1) බිය වී දෙවියන්ට හඬ ගැසිය යුතුය.
(2) නොසැලී දේව මග පෙන්වීම අනුව ක්‍රියාකළ යුතුය.
(3) දෙවියන් කොහේදැයි සොයා යා යුතුය.
(4) ජේසුස් වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටිය යුතුය.

37. තමන්ගේ කඩු වලින් නගුල් ද හෙල්ල වලින් දෑකැති ද තලා ගනු ලබනු බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා දිවැසිවරයාය.
(2) ආමෝස් දිවැසිවරයාය.
(3) එසකියෙල් දිවැසිවරයාය.
(4) මීකා දිවැසිවරයාය.

38. වර්තමාන සමාජය දෙස බලන කල පුද්ගලයාගේ පවුල් සංස්ථාවේ, සමස්ත සමාජයේ පිරිහීමක් සිදු වෙමින් පවතින බව අපට පෙනීයයි. එසේ වීමට හේතු වී ඇත්තේ,

(1) මිනිසා දේව කැමැත්තට පිටුපා ක්‍රියා කිරීමයි.
(2) මිනිසා තනිව ජීවත් වීමට උත්සාහ කිරීමයි.
(3) මිනිසා එකිනෙකාට උදව්කර ගැනීමයි.
(4) මිනිසා ආගමික සිද්ධස්ථාන වලට නොයෑමයි.

39. ජේසුස් වහන්සේ ජීවමාන බව සමාජයට පෙන්වීමේදී ඔබ කිතුණුවකු වශයෙන් සාක්ෂි දැරිය යුතු වන්නේ,

(1) ශුභාරංචිවල සඳහන් උපමා කථා පැවසීමෙන්ය.
(2) දේවදූතයා මරියතුමීට පැවසූ වදන් පෙන්වා දීමෙන්ය.
(3) තම ජීවිත වෙනස්වීම තුළින් කිතුණු ආකල්ප ක්‍රියාවට නැංවීමෙන්ය.
(4) වෙනත් අය කරන හොඳ කියාපෑමෙන්ය.

40. කිතුණු දරුවෙකු ලෙස ඔබ සමාජයේ ජීවත් වීමේදී විවිධාකාර ප්‍රශ්න වලට මුහුණපාන විට,

(1) ක්ෂණික තීරණ වලට එළඹිය යුතුය.
(2) ප්‍රශ්න වලට මුහුණ දෙමින් ඉදිරියට යාමට දේව මඟපෙන්වීම අයදිය යුතුය.
(3) තාවකාලික සහන ලබා දෙන මාර්ග වලට යොමු විය යුතුය.
(4) ප්‍රශ්න ගණන් නොගෙන තමන්ගේ පාඩුවේ තමාගේ වැඩ වල යෙදිය යුතුය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය - II** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) මේසියස් වහන්සේගේ එනම් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම සම්බන්ධව දිවැස්වැකි ප්‍රකාශ කරන ලද දිවැසිවරුන් දෙදෙනෙක් නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වර්ධනය සම්බන්ධයෙන් ඉගැන් වූ උපමා දෙකක් සඳහන් කරන්න.

(iii) හෙබ්‍රෙව් භාෂාවෙන් හා ග්‍රීක භාෂාවෙන් සාමය පැතීම හඳුන්වන්නේ කුමන නම් වලින් ද?

(iv) ජේසුස් වහන්සේ කෙරෙහි අදහා ගන්නා සැමට ප්‍රාතිහාර්යාත්මක ලෙසින් නව ජීවනයක් ලැබෙන බව සංකේතවත් කරමින් ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(v) එකල ජුදෙව් ජනතාවට බදුවර්ග දෙකක් ගෙවීමට සිදුව තිබුණි. එම බදුවර්ග දෙක හා ඒවා ගෙවීමට භාවිතා කළ කාසිවර්ග දෙකක් සඳහන් කරන්න.

(vi) දෙවියන් වහන්සේ විසින් ප්‍රධානය කරන ලද දස පනත බෙදා දැක්විය හැකි කොටස් දෙක සඳහන් කරන්න.

(vii) කිතුණු ප්‍රජාව ''නාසරෙත්හි ප්‍රකාශනය'' ලෙස පිළිගන්නා වූ'' ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද ප්‍රකාශනය ලියා දක්වන්න.

(viii) රෝමය බලාගිය ධර්මදූත ගමන සඳහා පාවුල්තුමා සමග සහභාගි වූ සහායකයන් දෙදෙනා නම් කරන්න.

(ix). ගලීල මුහුද හඳුන්වනු ලබන වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

(x). ''එපමණක් නොව පීඩා විඳීමෙන් ඉවසීමද ඉවසීමෙන් තැන්පත් බවද තැන්පත් බවෙන් බලාපොරොත්තුව ද උපදින බව දන අපි විඳින පීඩා වලදී වුවද ප්‍රීති ප්‍රමෝධ වෙමු.'' මෙම ප්‍රකාශනය සඳහන් වන ලිපිය කුමක් ද? එය ලියන ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 2 × 10 = 20)

(02) (i) ජුදෙව් සමාජය තුළ තම අනන්‍යතාවය සහිතව ජීවත් වෙමින්, ජුදෙව්වන් විසින් ඉටුකරන ලද වත්පිළිවෙලින් දෙකක් නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේගේ දෙමාපියන් උන්වහන්සේ වෙනුවෙන් ඉටුකරන ලද වත්පිළිවෙත් තුනක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(iii) ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ පවතින කිතුණු විශ්වාසයන් හා සිරිත්විරිත් පිළිබඳ පුවත්පතකට ලිපියක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) ''පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප කිරීම ජේසුස් වහන්සේ පිළිවෙත නොවීය.''

(i) ඉහත ප්‍රකාශය සනාථ කරමින් ජේසුස් වහන්සේ නිසා තම ජීවිතය වෙනස් කරගත් එනම් අර්ථවත් කරගත් පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.

(ii) උක්ත කියමන ජේසුස් වහන්සේ විසින් ක්‍රියාවට නැගූ අවස්ථා තුනක් උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

(iii) ඉහත කියමන ක්‍රියාවට නන්වමින් ක්‍රිස්තුස් වහන්සේ අනුගාමී වන වත්මන් කිතුණුවා ක්‍රියාකළ යුත්තේ කෙසේදැයි කරුණු පහක් යටතේ පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) පාවුල්තුමාගේ දෙවන ධර්මදූත ගමන සඳහා සහභාගී වූ සිව්දෙනෙක්ගේ නම් සඳහන් කරන්න.

(ii) පාවුල්තුමා දෙවන ධර්මදූත චාරිකාව තුළ ශුද්ධාත්ම මග පෙන්වීම අනුව යමින් ද සැබෑ කිතුණු නායකත්ව ගුණාංග විදහා පාමින්ද සාක්ෂි දරූ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පහදන්න.

(iii) පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාව තුළදී මුහුණ දීමට සිදු වූ අභියෝග හා එහිදී ක්‍රියාකළ ආකාරය තුළින් කිතුණු අපට ලබා ගත හැකි ආදර්ශ දහයක් පෙළ ගස්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) කිතුණු පවුලේ පූර්වාදර්ශය කුමක් ද? එහි නිර්මාතෘ කවුද?

(ii) ශුද්ධ පාවුල් තුමාගේ එපීස ලිපියටඅනුව භාර්යාවට ස්වාමිපුරුෂයා සම්බන්ධයෙනුත් ස්වාමිපුර්ෂයාට භාර්යාව සම්බන්ධයෙනුත්, දරුවන්ට දෙමාපියන් සම්බන්ධයෙනුත් ක්‍රියා කරන්නට උපදෙස් ලබා දෙන්නේ කෙසේද?

(iii) සමාජය තුළ ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරමින් ජීවත් වීමේදී කිතුණු අප ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න යෝජනා දහයක් මඟින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාජිකයන් තෝරා ගනු ලබන පාර්ශව දෙක නම් කරන්න.

(ii) දුක්ප්‍රාප්තියට පෙර ජේසුස් වහන්සේ මුහුණ දුන් ආසන්නම සිදුවීම් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජේසුස් වහන්සේ ගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධවූවන් බොහෝ දෙනෙකි. මේ අය අතුරින් විනිශ්චයෙන් පසු කුරුසපත් කිරීම දක්වා කාලය තුළ උන්වහන්සේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ වූ පිරිස් පහක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) පහත මාතෘකා අතරින් දෙකක් පමණක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) ශුද්ධ පාවුල් තුමාගේ සේවය හා ජීවිත පසුබිම

(ii) දිවැසිවර ආමොස්

(iii) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය

(iv) මුල්කිතුණු සභාව

(ලකුණු 5 × 2 = 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **අවසාන වාර පරීක්ෂණය 2016**

**11 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(2) | 4 -(3) | 5 -(1) | 6 -(3) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(3) |
| 11 -(1) | 12 -(1) | 13 -(4) | 14 -(2) | 15 -(1) | 16 -(4) | 17 -(1) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21 -(2) | 22 -(4) | 23 -(4) | 24 -(3) | 25 -(2) | 26 -(3) | 27 -(1) | 28 -(2) | 29 -(3) | 30 -(4) |
| 31 -(1) | 32 -(2) | 33 -(1) | 34 -(3) | 35 -(3) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) ජෙරමියා දිවැසිවරයා, යෙසායා දිවැසිවරයා (ii) අබ ඇටය, මුහුන්, වපුරන්නාගේ උපමාව (iii) හෙබ්‍රෙව් ශලෝම් / ග්‍රීක අයිරේනියා (iv) නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණින් උත්ථාන කිරීම (v) අධිරාජ්‍ය බද්ද රිදියෙන් තනන ලද දිනාර් / දේවස්ථාන බද්ද තඹකාසි (vi) මිනිසා දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාව / මිනිසා මිනිසා සමඟ පැවතිය යුතු ගුණධර්ම හා මිනිස් සබඳතා (vii) සමිඳාණන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීමද අන්ධයින්ට පෙනීමද ලැබෙන බව දන්වන්නටත් පීඩිත වූවන් මුදන්නටත්, සමිඳාණන් වහන්සේගේ ප්‍රසාදලත් වසර ප්‍රකාශ කරන්නටත් මා ආලේප කළ සේක. (viii) ලූත් හා අරිස්තාර්තස් (ix) තිබේරියස් මුහුද (තිබේරියස් විල) ගෙනසෙරෙත් විල (x) රෝම ලිපිය, ශුද්ධ වූ පාවුල්තුමා විසින්

(02) (i) චර්මඡේදනය කැපකිරීම (ii) ජේසුස් වහන්සේ වෙනුවෙන් ඉටුකළ චර්මඡේදනය කැපකිරීම හා දොළොස් වියේදී ජෙරුසලම් දේව මාළිගයට රැගෙන යෑම, ටෝරාව වනපොත් කිරීම ජුදෙව් ව්‍යවස්ථාවට අනුව දරුවන් ගොඩ නැගීම යන කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (iii) කිතුණුවන් ලෙස සභාවක් තුළ ඉටුකරනු ලබන චාරිත්‍ර එනම් ශුද්ධ බයිතීස්මය, කැපකිරීම, ශුද්ධ සහභාගීත්වය, ශුද්ධ විවාහය, ඉදුල්කට ගෑම, අකුරු කියවීම, ගෙවැදීම ව්‍යාපාර ස්ථාන ආසිරි ගැන්වීම, මුල්ගල තැබීම හා රෝග යනාදී අවස්ථාවන් හා අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු කරන ආකාරය යනාදි වත්පිළිවෙත් 05 ක් සිදුකරන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(03) (i) සංතෙවුස්ගේ නිවසට යෑම, පව්කාර ස්ත්‍රියට වරද නොතැබීම, සමාරිය ස්ත්‍රියගෙන් බීමට ජලය ඉල්ලා සිටීම යනාදී පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න. (ii) ඉහත සඳහන් පුද්ගලයින් ප්‍රතික්ෂේප නොකොට ඔවුන්ගේ ක්‍රියාවන් ප්‍රතික්ෂේප කරමින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව ලබා දුන් ආකාරය හා ජේසුස් වහන්සේ පාවාදීම, පේදුරු ජේසුස් වහන්සේව නාඳුනන බව කීමත්, ජේසුස් වහන්සේ ඔහුට අනුකම්පා කොට ආදරය කිරීම, උත්තම පූජකයාගේ දාසයාගේ කන කැපීම අනුකම්පා කර සුවකිරීම, උන්වහන්සේට අපහාස කරමින් කුරුසපත් කළ අයට සමාව දීම. (iii) සොරකමට, වංචාවට, දූෂණයට, නොමඟ යැවීම් වලට, බේබදුකමට, ස්ත්‍රී දූෂණයට, ළමා අපචාරයට, සිරගත වීම්, ගණිකාවන්, මංකොල්ල කරුවන් මත්කුඩුවලට ඇබ්බැහි වූවන්, ඒඩ්ස් වැනි සමාජ රෝගීන් පුද්ගලයන් ලෙස සමාජයෙන් කොන් නොකර දේවස්ථානයෙන් හා සමිති සමාගම් වලදී ඔවුන් පිළිගනිමින් වරද පෙන්වා දෙමින් සහෝදරත්වයෙන් පිළිගැනීම වැනි පිළිතුරු සලකාබලා ලකුණු ලබා දෙන්න.

(04) (i) බර්ණබස් ජොහාන් මාර්ක්, තිමෝති / පාවුල් සීලස්, ලූක් (ii) 11 ශ්‍රේණියේ, පෙළපොතේ 57, 59, 60, 61, 62 පිටු උපයෝගී කර ගනිමින් සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. පිලිප්පි, ඇතන්ස්, කොරන්ති සභා වල සාක්ෂිදැරීම්. (iii) ● මත ගැටුම් වලදී ඉවසීමෙන් කටයුතු කිරීම. ● අන්‍යයන්ට ඇහුම්කන් දීම ● අන්මත ගරු කිරීම ● ආරම්භ කළ කාර්ය අභියෝග මධ්‍යයේ වුවද නිමා කිරීම. ● යමක් ආරම්භ කිරීමට පෙර ශුද්ධාත්ම මඟ පෙන්වීම සෙවීම හා විවෘත වීම. ● පිලිප්පි සිදුවීමට අනුව හැමවිටම ඇදහිල්ලෙන් විශ්වාසවන්තව කටයුතු කිරීම. ● තමන් ඉන්න කවර ස්ථානයක හෝ කවර තත්වයක් තුළ හෝ සාක්ෂි දැරීම. ● ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තව කටයුතු කිරීම. ● නොපසුබට උත්සාහයෙන් යුක්තව කටයුතු කිරීම. පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

(05) (i) ශුද්ධ වූ පවුල / දෙවියන් වහන්සේ (ii) ● භාර්යාවන්ට භාර්යාවෙනි, ඔබ සමිදාණන්ට මෙන් ඔබේ ස්වාමි පුරුෂයාට යටත්ව සිටින්න. ● ස්වාමි පුරුෂයන්ට පුරුෂයෙනි ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව

වෙනුවෙන් දිවි පුදකලාක්මෙන් ඔබත් ඔබේ භාර්යාවන්ට ප්‍රේම කරන්න. ● දරුවන්ට ඔබේ දෙමාපියන්ට සමිදාණන් වහන්සේ තුළ කීකරු වන්න. එය ඔබගේ යුතුකමකි. (iii) ● සාහිගිනිවූවන්ට කන්න දීමෙන් ● පිපාසිත වූවන්ට බොන්න දීමෙන් ● රෝගාතුර වූවන් බලාගැනීමෙන් ● අයහපතට නැඹුරු වූවන් මුදවා ගැනීමෙන් ● අසරණවූවන් පිළිගැනීමෙන් ● නිළධාරීන්ට හා ආණ්ඩුබල ඇත්තන්ට යටත් වීමෙන් ● සියලු යහපත් වැඩට සූදානම්ව සිටීමෙන් ● සමාජයේ සියලු දෙනා සමඟ තරාතිරම් නොබලා කටයුතු කිරීමෙන් යනාදී කරුණු සලකා බලා (ලකුණු ලබා දෙන්න.)

(06) (i) පරිසිවරු / සද්දුසිවරු (ii) ● අන්තිම රාත්‍රී භෝජනය ● ගෝලයන්ගේ පාද සේදීම ● ගෙත් සෙමනේ යාච්ඤාව පිළිබඳ කෙටි විස්තරයක් ඇත්නම් ලකුණු පිරිනමන්න. (iii) පේදුරු, සිරේනියේ සීමෙන්, ස්ත්‍රීන්, මුර සෙබළුන්, අරමාතියේ ජෝසප් යනාදී චරිත හඳුන්වා දෙමින් ඔවුන්ගේ ක්‍රියා කලාපය විස්තර කර තිබීම.

(07) ● කෙටි සටහන් හතරෙන් දෙකකට පිළිතුරු ලියා තිබීම. ● එක් කෙටි සටහනක් සඳහා කරුණු 05 ක් හෝ ඊට වැඩියෙන් ඇතුළත් කර විස්තර කර තිබේනම් ලකුණු 5 × 2 = 10 ක් ලබා දෙන්න. (කරුණු ගැන සලකා බලා ලකුණු පිරිනමන්න.)

<u>ලකුණු පිරිනැමීම</u>

| | |
|---|---|
| ප්‍රශ්න අංක 01 | ලකුණු 20 |
| ප්‍රශ්න අංක 02 සිට 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 ක් සඳහා 4 × 10 | ලකුණු 40 |
| මුළු ලකුණු 20 + 40 = | ලකුණු 60 |

The National e-learning Portal for The General Education